# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය
எனது

DSD/HO/05/MF/08/01-චක්‍රලේඛ

2026.02.03

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2026/01**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/ බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරුවන්,**

**<u>2026 මාර්තු.08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ක්‍රියාත්මක කරනු ලබන දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන.</u>**

**1. හැඳින්වීම.**

සමෘද්ධි ප්‍රජාමූල බැංකු ජාලයට අයත් බැංකු ඉතුරුම් රැස්කිරීමේ ප්‍රධාන ක්‍රමෝපායක් ලෙස ජාත්‍යන්තර දින වෙනුවෙන් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් දියත් කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව, ජාත්‍යන්තර කාන්තා දිනය, සිංහල / දෙමළ අළුත් අවුරුදු උත්සවය හා ජාත්‍යන්තර ළමා දිනය වෙනුවෙන් සිදුකරන ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් ඉන් ප්‍රධාන තැනක් ගනී.

සමෘද්ධි ප්‍රජාමූල බැංකු වැඩසටහනේ සුවිශේෂ තැනක් කාන්තාවන්ට හිමිවන අතර,එම තත්ත්වය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා දිරියමාතා ඉතුරුම් ගිණුම් තැන්පතු රැස්කිරීමේ අභිලාෂයෙන් 2026 මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනට සමගාමීව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ඒ සඳහා, 2026.01.06 දින පැවති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද මාණ්ඩලික පත්‍රිකා අංක 2025/144/01 ට ලබාදුන් අනුමැතිය මත, සමෘද්ධි දිරියමාතා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීමට මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කරන බව දන්වමි.

**2. ප්‍රවර්ධන වැඩසටහනේ අරමුණු**

i. කාන්තාව/ගෘහණිය සකසුරුවමට හුරු කිරීම සඳහා, අවශ්‍ය පරිසරය සැකසීම.

ii. සමෘද්ධි දිරියමාතා ඉතුරුම් තැන්පත් මුදල් රැස් කිරීම තුළින් බැංකු තැන්පතු අරමුදල් වැඩිකර ගැනීම.

iii. කාන්තාව/ගෘහණියට වඩාත් ප්‍රයෝජනවත් තිළිණයක් ලබාදීම තුළින්,තැන්පතු ගිණුම් සඳහා අමතර ප්‍රතිලාභයක් ලබාදීම.

**3. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වෙන කාල සීමාව හා ප්‍රවර්ධන වැඩසටහනට අදාළ ඉතුරුම් ගිණුම්**

i. 2026 මාර්තු මස 08 සිට 31 දින දක්වා ප්‍රවර්ධන වැඩසටහන පැවැත්වේ.

ii. සමෘද්ධි දිරියමාතා ඉතුරුම් තැන්පතු ගිණුම් හා කාන්තාවන් විසින් ආරම්භ කරන ස්ථාවර තැන්පතු ගිණුම් සඳහා අදාළ වේ.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி (நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28877** |

**4. ඉලක්ක සකස් කර ගැනීම හා දැනුවත් කිරීම**

4.1 ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ජාතික මට්ටමින් රු.මි. 250 ක තැන්පතු මුදලක් රැස් කිරීමට අපේක්ෂා කරන අතර,ඒ අනුව සමෘද්ධි බැංකුවක ඉලක්කය අවම රු.200,000 ක තැන්පතු මුදලක් වේ. එම ඉලක්කගත ඉතුරුම් මුදලට අනුව ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන සැළසුම් කිරීම සුදුසු වේ.

4.2 නමුත් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ සමෘද්ධි බැංකුවට හා ක්ෂේත්‍රගත නිලධාරීන්ට ඉලක්ක ලබා නොදේ. එමෙන්ම,සමෘද්ධි බැංකුව ද ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට ඉලක්ක ලබා නොදිය යුතුය.

4.3 සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැනුවත් කර, ඒ හරහා කාන්තාවන් දැනුවත් කළ යුතු අතර, ඒ සඳහා සමෘද්ධි බැංකු පාලක මණ්ඩල/ප්‍රජාමූල සංවිධාන නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය.

.

**5. තිළිණ ලබාදීම හා වියදම් දැරීම.**

5.1. තිළිණ සඳහා. 5% ක මුදලක් බැංකු අරමුදලින් වැයකළ හැකිය. එම මුදල ගණනය කිරීම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් කාලය තුළ රැස් කරන ලද මුළු තැන්පතු මුදලට සාපේක්ෂව 5% ක් ලෙස විය යුතුය.

5.2 ඉතුරුම් ප්‍රවර්ධන කාලය තුළ ඉතුරුම් සිදු කරන දිරියමාතා ගිණුම් හිමියන් හා ස්ථාවර තැන්පතු ගිණුම් හිමියන් සඳහා පහත සඳහන් තිළිණ ලබාදීම සඳහා අවසර ඇත.මෙම භාණ්ඩ ප්‍රසම්පාදන කටයුතු සිදු කර මිළදී ගැනීම සිදු කළ යුතුය.

| තැන්පතු මුදල් වටිනාකම රු. | තිළිණය ලෙස යෝජනා කරන අයිතමය | එක් අයිතමයකට වැයකළ හැකි උපරිම මුදල රු. |
|---|---|---|
| රු.2,000 සිට රු.5,000 දක්වා | තෝරාගත් තිළිණයක් | 250/= |
| රු5,001 සිට රු.7,500 දක්වා | තෝරාගත් තිළිණයක් | 400/= |
| රු.7,501සිට රු.10,000 දක්වා | ප්‍රමිතියෙන් යුත් 1W-5W අතර LED rechargeable Torch 1 ක් | 800/= |
| රු.10,001 ට වැඩි | විදුලි කේතලයක් (Electric jug kettle) | 2000/= |

5.3 කාන්තාවන් විසින් ආරම්භ කරනු ලබන රු.100,000.00 හෝ ඊට වැඩි ස්ථාවර තැන්පතු සඳහා රු. 1,000.00 ක වටිනාකමක් සහිත සුදුසු තිළිණයක් ලබාදීම කළ යුතුය. සියළු තිළිණ ලබාදීමේදී ඉහත ඡේද අංක 5.1 හි සඳහන් මුදල් සීමාව නොඉක්මවිය යුතුය.

5.4 ප්‍රවර්ධන කාලය තුල රු.2,000/- ට අඩු මුදලක් තැන්පත් කළ ගිණුම් හිමියන්ට තිළිණය ලබාදීම නොකළ යුතුය.

5.5. තිළිණ සඳහා වැයවන වියදම, වැය ගිණුම - බැංකු කටයුතු ප්‍රවර්ධන ගිණුමට හර කළ යුතුය.

5.6 තිළිණ මිළදී ගැනීම වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ උපදෙස් අනුව සිදුකළ යුතුය.

5.7 ප්‍රවර්ධන වැඩසටහන ආරම්භ කිරීමට පෙර, තිළිණ තෝරා ගැනීම, ප්‍රසම්පාදන කටයුතු කිරීම, ප්‍රදර්ශනය කිරීම හා දැනුවත් කිරීම සිදු කළ යුතුය. ඒ සඳහා සුදානම් විමටචක්‍රලේඛ උපදෙස් කළින් ලබාදීම සිදුකරන බව දන්වමි.

5.8 තිළිණ ලබාදෙන ඉතුරුම් ගිණුම් හා ස්ථාවර තැන්පතු සඳහා මුදල් තැන්පත් කළ දින සිට මාස 12 ක් ගිණුමේ රඳවාගත යුතුය.ගිණුම් හිමියා හෝ පවුලේ සාමාජිකයකුට ඇතිවන විශේෂ විපතක්/රෝගී තත්ත්වයකදී පමණක් මුදල් නිදහස් කිරීමට අවසර ඇත.අනිකුත් අවස්ථාවක තැන්පතු නිදහස් කරන විටක තිළිණයේ පිරිවැයෙන් 50% ක මුදලක් අයකළ යුතුය.එම මුදල් ලද ආදායම් - මිශ්‍ර ගිණුමට රැස් කළ යුතුය.

5.9 මෙම ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකා මුද්‍රණය හෝ බැනර් පිළියෙල කරගැනිම සඳහා රු.3000/- ක මුදලක් වැය කිරීමට අවසර දෙනු ලැබේ. මෙම වියදම, බැංකු ප්‍රවර්ධන ගිණුමෙහි සටහන් කළ යුතුය.

06. මෙම වැඩසටහන සාර්ථක කරගැනීමට ඔබ ඇතුළු බැංකු,ක්ෂේත්‍රගත නිළධාරින් හා බැංකු පාලක මණ්ඩල / ප්‍රජාමුල සංවිධාන සභාපතිවරුන්/සමාජිකයින්ගේ සහය අපේක්ෂා කරමි.

සී.ඩී.කළුආරච්චි.
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම් - ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස./ අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - අ.ක.ස.
4. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - අ.ක.ස.
5. ප්‍රාදේශීය ලේකම් - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස./ අ.ක.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සභාපති - සමෘද්ධි ප්‍රජාමුල බැංකු මහා සංගමය - කා.දැ.ස./ අ.ක.ස.